# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1714/4 - 2011 ජූලි 11 වැනි සඳුදා - 2011.07.11

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්. ඩී. බී. 3/2010.

**2008 අංක 14 දරන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත**

3 වැනි වගන්තියේ (4) වැනි උපවගන්තිය යටතේ කරන ලද නියමය

2008 අංක 14 දරන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනතේ 3 වැනි වගන්තියේ (4) වැනි උපවගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, ආර්ථික සංවර්ධන අමාත්‍ය බැසිල් රෝහණ රාජපක්ෂ වන මා විසින් මෙම නියමය මගින් -

(1) ඉහත කී පනතේ කාර්ය සඳහා ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘතියක් වශයෙන් හඳුනාගනු ලැබූ දකුණු පළාතේ, හම්බන්තොට පරිපාලන දිස්ත්‍රික්කයේ, සුඛෝපභෝගී හෝටලයක් සහ නේවාසික ඒකක සහ/හෝ විලාස් ඉදිකිරීම සඳහා වූ ව්‍යාපෘතියක් පිළිබඳ අදාළ තොරතුරු ඇතුළත් නිවේදනය 2011 අප්‍රේල් මස 5 වැනි දින අංක 1700/5 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරනු ලැබූ බවත්,

(2) දකුණු පළාතේ, හම්බන්තොට පරිපාලන දිස්ත්‍රික්කයේ සුඛෝපභෝගී හෝටලයක් සහ නේවාසික ඒකක සහ/හෝ විලාස් ඉදිකිරීම සඳහා වූ ව්‍යාපෘතිය ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘතියක් ලෙස ප්‍රකාශයට පත් කිරීමට 3 වැනි වගන්තියේ (3) වැනි උපවගන්තිය ප්‍රකාරව අමාත්‍ය මණ්ඩලයේ අනුමතය ලබාගෙන ඇති බවත්,

(3) ඉහත ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘතිය "දකුණු පළාතේ, හම්බන්තොට පරිපාලන දිස්ත්‍රික්කයේ සුඛෝපභෝගී හෝටලයක් සහ නේවාසික ඒකක සහ/හෝ විලාස් ඉදිකිරීම සඳහා වූ ව්‍යාපෘතිය" යනුවෙන් හඳුන්වනු ලබන සහ සඳහන් කරනු ලබන බවත්,

(4) "දකුණු පළාතේ, හම්බන්තොට පරිපාලන දිස්ත්‍රික්කයේ සුඛෝපභෝගී හෝටලයක් සහ නේවාසික ඒකක සහ/හෝ විලාස් ඉදිකිරීම සඳහා වූ ව්‍යාපෘතිය" ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සහ ව්‍යාපෘති සමාගම අතර ව්‍යාපෘති ගිවිසුම අත්සන් කළ දිනය වූ 2011 පෙබරවාරි මස 7 වැනි දින සිට මාස 36 ක කාල සීමාවක් වන 2014 පෙබරවාරි මස 7 වැනි දින එකී ව්‍යාපෘතියේ වාණිජ මෙහෙයුම් කටයුතු ආරම්භ කළ යුතු බවත්,

(5) "දකුණු පළාතේ, හම්බන්තොට පරිපාලන දිස්ත්‍රික්කයේ සුඛෝපභෝගී හෝටලයක් සහ නේවාසික ඒකක සහ/හෝ විලාස් ඉදිකිරීම සඳහා වූ ව්‍යාපෘතිය" සම්බන්ධයෙන් මේ නියමයේ උපලේඛනයේ නිශ්චිතව සඳහන් ප්‍රඥප්ති අදාළ වීමෙන් නිදහස් වීම, එම උපලේඛනයේ නිශ්චිතව දැක්වෙන සීමා කිරීම් වලට යටත්ව ආරම්භ විය යුතු බවත්, එකී නිදහස් කිරීම් උපලේඛනයේ නිශ්චිතව දැක්වෙන කාලය සඳහා ක්‍රියාත්මක විය යුතු බවත්,

ප්‍රකාශයට පත් කරමි.


1A - G 14778— 730 (2011/07)

උපලේඛනය

"දකුණු පළාතේ, හම්බන්තොට සුඛෝපභෝගී හෝටලයක් සහ නේවාසික ඒකක සහ/හෝ විලාස් ඉදිකිරීම සඳහා වූ ව්‍යාපෘතියට" ප්‍රදානය කරනු ලබන නිදහස් කිරීම්.

1. 2006 අංක 10 දරන දේශීය ආදායම් පනත

- සමාගම බද්දට යටත් ලාභ උපදවන පළමු වසරේ (0) සිට හෝ සමාගම වාණිජ ක්‍රියාකාරකම් ආරම්භ කිරීමෙන් පසුව වසර තුනක (03) සිට සහ කලින් එළඹෙන කාල සීමාවේ සිට ආරම්භ වන්නාවූ දේශීය ආදායම් පනත යටතේ වූ වසර දහයක (10) සාමුහික ආදායම් බදු නිදහස් කාලසීමාවක්, බදු නිදහස් කාලසීමාවේ අවසන් දිනයට ඉක්බිතිව ම එළඹෙන දින සිට තවදුරටත් වූ වසර පහලවක (15) කාලයක් සඳහා එක් එක් තක්සේරු වර්ෂය සඳහා අදාළ බදු අනුපාතිකයෙන් අඩක් වන්නාවූ සියයට හයක (6%) අනුප්‍රමාණයකට සමාන බදු නිදහස් කිරීම් කොටසක් ප්‍රදානය කරනු ලැබේ. සැකදුරුකිරීමේ කාර්ය සඳහා, ඉහත සඳහන් ආකාරයට වසර විසිපහක් (25) සම්පූර්ණ වීමෙන් පසුව ව්‍යාපෘතිය ආරම්භ කරනු ලබන සමාගමට අදාළව එම කාලයේ පවත්නා සාමාන්‍ය බදු ක්‍රමය අදාළ විය යුතු බවට සලකනු ලැබිය යුතුය.

- ලාභවලින් කොටස් හිමියන්ට බෙදා හරිනු ලබන ලාභාංශ වසර දහයක බදු නිදහස් කිරීමේ කාලය තුළ සහ ඉන්පසුව වසර එකක (1) කාලයක් සඳහා ආදායම් බද්දෙන් නිදහස් කරනු ලැබිය යුතුය.

- සමාගමේ විදේශීය කාර්ය මණ්ඩලයෙන් විසි දෙනෙකුගේ උපරිමයකට යටත්ව උපයන විට ගෙවීමේ ක්‍රමය යටතේ වසර පහක කාලයක් සඳහා බදුවලින් නිදහස් කරනු ලැබිය යුතුය.

(අ) ප්‍රාග්ධන වියදම් සඳහා ලබාගත් විදේශ ණය මත පොලිය,
(ආ) උපදේශකයන්ට ගෙවන ලද තාක්ෂණික ගාස්තුව,
(ඇ) කළමනාකරණ ගෙවීම්, රාජ්‍යභාග ගෙවීම් සහ අලෙවි කරන ගෙවීම්,

සීමාසහිත ෂැන්ග්‍රිලා ඒෂියා සමාගමේ පහත සඳහන්-

* සීමාසහිත ෂැන්ග්‍රිලා ඉන්ටර්නැෂනල් හොටෙල් මැනේජ්මන්ට් - හොංකොං
* ෂැන්ග්‍රිලා ඉන්ටර්නැෂනල් හොටෙල් මැනේජ්මන්ට් - (B. V.)
* සීමාසහිත ෂැන්ග්‍රිලා ඉන්ටර්නැෂනල් හොටෙල් මැනේජ්මන්ට් (පුද්ගලික) සමාගම - සිංගප්පූරුව

යන අනුබද්ධ ආයතනවලින් එක් ආයතනයකට කර ඇත්නම් සමාගම රඳවා ගැනීමේ බදු ගෙවීමෙන් නිදහස් කල යුතුය.

එසේම, මුලික කළමනාකරණ ගාස්තුව, රාජ්‍ය භාග වශයෙන් සිදු කරන ලද ගෙවීම්, දළ මෙහෙයුම් ආදායම්වලින් සියයට තුනක (3%) ප්‍රමාණයක්, අලෙවි කරන ගෙවීම් දළ මෙහෙයුම් ආදායම්වලින් සියයට එකයි දශම පහක (1.5%) ප්‍රමාණයක් සහ කළමනාකරණ දිරි දීමනා ගාස්තු වශයෙන් සිදු කරන ලද ගෙවීම් දළ මෙහෙයුම් ලාභවලින් සියයට දහයක (10%) ප්‍රමාණයක් නොඉක්මවිය යුතුය.

2. 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනත

ව්‍යාපෘතියේ ඉදිකිරීම් කාලය තුළ ව්‍යාපෘතියට අදාළ භාණ්ඩ ආනයනය කිරීම සහ ව්‍යාපෘතියට අදාළ දේශීය වශයෙන් මිලදී ගනු ලබන භාණ්ඩ හා සේවාවන් මත එකතු කළ අගය මත බදු ගෙවීම.

3. 2011 අංක 18 දරන වරාය හා ගුවන් තොටුපල සංවර්ධන අයකිරීම් පනත -
ව්‍යාපෘතිය ඉදිකිරීම් කාලය තුළ වරාය සහ ගුවන් තොටුපල සංවර්ධන අය කිරීම්වලින් නිදහස් වේ.

4. (235 වැනි අධිකාරය වූ) රේගු ආඥාපනත - ව්‍යාපෘතියේ අවශ්‍යතාවන්වලට පමණක් ආනයනය කරනු ලබන අයිතම සම්බන්ධයෙන් ඉදිකිරීම් කාලය තුළ ව්‍යාපෘතිය ආරම්භ කරන සමාගම නමින් ආනයනය කෙරෙන සියළු ප්‍රාග්ධන භාණ්ඩ සම්බන්ධයෙන් රේගු බදු නිදහස් කිරීම අදාළ වන්නේ ය.

බැසිල් රෝහණ රාජපක්ෂ,
ආර්ථික සංවර්ධන අමාත්‍ය.

2011 ජුලි මස 11 වැනි දින,
කොළඹ දී ය.

07-624

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.